# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

## ආර්ථික විද්‍යාව

## සූක්ෂම ආර්ථික විද්‍යාව - ECON 28214

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. යථානුරූපී ආර්ථික විද්‍යාව සහ අභිමතානුරූපී ආර්ථික විද්‍යාව අතර වෙනස උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. සංඛ්‍යා සූචක උපයෝගිතා ප්‍රවේශය සහ ක්‍රම සූචක උපයෝගිතා විශ්ලේෂණය අතර පවතින මූලධර්මීය වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii. ආන්තික උපයෝගිතාව සහ හීනවන ආන්තික උපයෝගිතා නීතිය පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. ආන්තික තාක්ෂණික ආදේශන අනුපාතය (MRTS) යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

v. නිෂ්පාදන ආයතනයක ලාභ උපරිම වීම සඳහා (සමතුලිතය සඳහා) තෘප්තවිය යුතු අවශ්‍ය කොන්දේසිය හා ප්‍රමාණවත් කොන්දේසිය පැහැදිලි කරන්න. (ලකුණු 03)

vi. අතිප්‍රාමාණි ලාභ සහ ප්‍රාමාණික ලාභ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

vii. මුළු පිරිවැය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

viii. ආර්ථික බදු කුලිය යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

02. ආර්ථික විද්‍යාව පිළිබඳ විවිධ අර්ථ දැක්වීම් ඇසුරින් එය ''ස්ථායිතාව සමග ආර්ථික වෘද්ධිය හා කාර්යක්ෂමතාව අත්කර ගැනීම සහ පවත්වා ගෙනයාම සඳහා යෝග්‍ය පරිදි සම්පත් භාවිතා කරන හා බෙදාහරින සමාජීය විද්‍යාවක්'' බව පෙන්වා දෙන්න. (ලකුණු 20)

03. i. ආන්තික උපයෝගිතා න්‍යායේ දී භාවිතා කරන උපලකල්පන පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. වෙළෙඳපොළේ එක් භාණ්ඩයක් පමණක් පවත්නා තත්ත්වයක් යටතේ පාරිභෝජකයා සමතුලිත වන ආකාරය කල්පිත උදාහරණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. වෙළෙඳපොළේ X හා Y යන භාණ්ඩ දෙක පමණක් පවතී නම්, දෙන ලද ආදායම් සංරෝධකයට යටත්ව පාරිභෝගිකයා තෘප්තිමත් වන භාණ්ඩ සංයෝගය තෝරා ගන්නේ කෙසේදැයි සංඛ්‍යාත්මක උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. i. උපේක්ෂ වක්‍ර හඳුන්වා, උපේක්ෂ වක්‍ර විශ්ලේෂණයේ දී භාවිත කරන උපකල්පන විස්තර කරන්න. (ලකුණු 05)

ii. උපේක්ෂ වක්‍රවල ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. උපේක්ෂ වක්‍රවල හැඩය පරිභෝජනය කරන භාණ්ඩවල ස්වරූපය මත වෙනස් වන ආකාරය ප්‍රස්තාර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. උපේක්ෂ වක්‍ර විශ්ලේෂණය තුළ පරිභෝජක හැසිරීම විග්‍රහ කිරීමේ දී අයවැය සංරෝධකය අත්‍යවශ්‍ය විග්‍රහ උපකරණයක් වන්නේ කෙසේදැයි විමසන්න. (ලකුණු 05)

05. i. භාණ්ඩයක මිල වෙනස්වීමේ ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය හඳුන්වන්න. (ලකුණු 05)

ii. සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවීමේ ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක වෙන්කරන ආකාරය ඔබ දන්නා ප්‍රවේශයන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

iii. ආදායම් පරිභෝජන වක්‍රය හා මිල පරිභෝජන වක්‍රය හඳුන්වා දෙන්න. (ලකුණු 05)

06. i. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ''පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ සහ ඒකාධිකාරී වෙළෙඳපොළ අතර අතරමැදි වෙළෙඳපොළ තත්ත්වයක් ලෙස ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළ හඳුනාගත හැක.'' විමසන්න. (ලකුණු 10)

07. i. කතිපයාධිකාරී වෙළෙඳපොළ ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළ ආකෘතියෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. ''ආයතන අතර අන්‍යොන්‍ය රැඳියාව කතිපයාධිකාරී වෙළෙඳපොළක විශේෂ ලක්ෂණයකි.'' පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. ව්‍යවර්තික ඉල්ලුම් වක්‍ර විග්‍රහය ඇසුරින් කතිපයාධිකාරී වෙළෙඳපළක මිල දැඩියාවක් පවතින බව තහවුරු කරන්න. (ලකුණු 10)

08. අ) පහත දැක්වෙන කෙටිකාලීන පිරිවැය සංකල්ප හඳුන්වා ඒවා ද්වීමාන සටහනක නිරූපණය කරන්න.

i. ස්ථාවර පිරිවැය (FC)
ii. විචල්‍ය පිරිවැය (TVC)
iii. මුළු පිරිවැය (TC)
iv. සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)
v. සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)
vi. සාමාන්‍ය මුළු පිරිවැය (AC)
vii. ආන්තික පිරිවැය (MC)

(ලකුණු 12)

ආ) කෙටිකාලීන නිෂ්පාදනයේ දී මුළු ඵලදාව, සාමාන්‍ය ඵලදාව සහ ආන්තික ඵලදාව හැසිරෙන ආකාරය ප්‍රස්ථාර සටහනක නිරූපණය කර කෙටිකාලීන නිෂ්පාදන අවධි පෙන්වන්න. (ලකුණු 08)

******************************